GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/03/26

**මාධ්‍ය නිවේදනයයි**

**හෙද ක්‍රියාමාර්ගයට හෙද සිසුන්ගේ සහ ඔවුන්ගේ දෙමව්පියන්ගේ කනස්සල්ල**

හෙද සිසුන් 1700ක් 2014 ජනවාරි 03 වනදා වන විට සිය තුන් වසර හෙද පාඨමාලාව නිමකර ඇත. රට තුල හෙද පුරප්පාඩු 5000ක් පමණ ඇති අතර සමහර රෝහල්වල ඒකක හෙද පුරප්පාඩුව නිසා විවෘත කර ගැනීමට නොහැකිව ඇත. විශේෂයෙන් උතුරු නැගෙනහිර ඇතුළු දුෂ්කර ප්‍රදේශවල රෝහල් ඒකක ඉදිකර විශේෂඥ වෛද්‍යවරුන් පත් කර ඇතත් හෙද හිඟය නිසා එම ඒකක අකර්මන්‍යව ඇත.

හෙද සිසුන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීම මෙතෙක් සිදු කර නැත. හෙද විදුහල්වල ප්‍රතිඵල නිකුත් නොකිරීම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් වශයෙන් කරගෙන යයි. මේ හේතුවෙන් ජනවාරි මස සිට හෙද වැටුප් ලැබිය යුතු පුහුණු හෙදියන් 1700ක් වැටුප් නොමැතිව මාස 03ක් ගත කර ඇත. ඊට අමතරව ඔවුන්ට වින්නඹු කර්මය ඉගෙන ගැනීමට හෙද වෘත්තීය සමිති බල කර ඇත. හෙද සිසුන්ගේ අනාගත බලාපොරොත්තු හා වරප්‍රසාද බිඳ දමමින් හෙද වෘත්තීය සමිති නායකත්වය ගෙන යනු ලබන මෙම ක්‍රියාමාර්ගයට විරුද්ධ මෙම හෙදියන් තමන්ගේ පත්වීම් ලබාදී නියමිත වැටුප් ලබාදෙන ලෙස ගරු සෞඛ්‍ය ඇමතිතුමාට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

ස්තුතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා : | වෛද්‍ය නවීන් සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |